www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: විශ්වවිද්‍යාල පෞද්ගලීකරනය කිරීම පිලිබඳ ව්‍යාජ විවාදයක්

**Sri Lanka: A phony debate on university privatisation**

**පානිනි විජේසිරිවර්ධන සහ**
**සුජීව අමරනාත් විසිනි.**
**2009 ජූලි 31**

ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) සම්බන්ධ ශ්‍රී ලංකාවේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) මේ මස මුල දී කොලඹදී "පෞද්ගලික විශ්වවිද්‍යාල හොඳද? නරක ද?" යන මාර්තෘකාව යටතේ ප්‍රසිද්ධ විවාදයක් පැවැත්වීය.

ආන්ඩුව සහ ආයෝජන මන්ඩලය විසින් පෞද්ගලික අයිතිය හිමි, මුදල් ගෙවිය යුතු වෛද්‍ය පීඨ දෙකක් සඳහා අනුමැතිය ලබා දීමත් සමග පෞද්ගලික විශ්වවිද්‍යාල පිලිබඳ මාර්තෘකාව නැවත ඉදිරියට පැමින ඇත. මෙම තීන්දුව නිදහස් අධ්‍යාපනය වෙත තවත් අලුත් ප්‍රහාරයක් වන අතර එය පොහොසතුන්ගේ දරුවන් සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාලත් අනෙකුන් සඳහා ගරාවැටුනු පොදු අධ්‍යාපන ආයතනත් වශයෙන් පන්ති දෙකක අධ්‍යාපන පද්ධතියක් නිර්මානය කිරීමක් වෙයි.

විශ්වවිද්‍යාල පෞද්ගලීකරනයට එරෙහිවන්නවුන් ලෙස පෙනීසිටීමේ ද ශිෂ්‍යයන් හා වැඩකරන ජනතාව අතර වර්ධනයවන ප්‍රතිවිරෝධය දඩමීමා කර ගැනීමේ ද අරමුනින් ජූලි 09 වන දින අවිශිබම විසින් විවාදය පවත්වන ලදී. කෙසේ නමුත් විවාදය විදහා දැක්වූ පරිදි ම අවිශිබම මෙන්ම ජවිපෙට ද පිලිතුරු ඇත්තේ නැත. මක්නිසාදයත් පෞද්ගලීකරනයට සහය දක්වන්නන් මෙන්ම ඔවුන් ද ලාභ පද්ධතිය පිලිගන්නා අතර ම හුදෙක් තම විරෝධතාවයන් ආන්ඩුවේ ප්‍රතිපත්ති වෙනස් කිරීමක් සඳහා බලපෑම් කිරීමකට පමනක් සීමා වන බැවිනි.

පුද්ගලික විශ්ව විද්‍යාලවල ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටින ප්‍රබලයෙක් ලෙස බොහෝ විට මාධ්‍ය මගින් දක්වා සිටින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක් වන නවරත්න බන්ඩා විවාදයේ පලමු කථිකයා විය. ඔහුගේ තර්කය ඍජු එකකි. වර්තමාන පොදු විශ්ව විද්‍යාල පද්ධතිය අධ්‍යාපනය අවශ්‍ය කරන සියල්ලන්ට ම අධ්‍යාපනය ලබාදීමට අසමර්ථ වී ඇත; එබැවින් ඉල්ලුම සැපිරීම සඳහා පෞද්ගලික විශ්ව විද්‍යාල ආරම්භ කල යුතුය. "2007 දී විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලැබූවන්ගෙන් රජයේ විශ්ව විද්‍යාලයකට ඇතුලත්වීමේ අවස්ථාව ලැබුනේ 15% කට පමනකැ"යි ඔහු පෙන්වා දුන්නේ ය.

සමස්ත නිදහස් අධ්‍යාපනය පිලිබඳ අදහසට ම ප්‍රහාර එල්ල කිරීමට පෙලඹුන නවරත්න බන්ඩා "ලෝකයේ කිසි ම ආන්ඩුවකට සෑම දෙනාටම නිදහස් අධ්‍යාපනය ලබාදීමේ හැකියාවක් නැත" යනුවෙන් අවධාරනය කලේ ය. "සැමටම නිදහස් අධ්‍යාපනය ලබාදීමේ ඉල්ලුම" "යුතෝපියාවක් (සිහිනයක්) ලෙස ප්‍රතික්ෂේප කල ඔහු "ඒ සඳහා වියදම් කල හැකි අයට අධ්‍යාපනය ලැබීම සඳහා අංග සම්පූර්න සහ තත්ත්වයෙන් උසස් විශ්වවිද්‍යාල ආරම්භ කල යුතුය" යනුවෙන් නිගමනය කලේය. නවරත්න බන්ඩාගේ පන්ති පක්ෂපාතීත්වය පැහැදිලිය. ඔහු පෙනී සිටියේ හුදෙක් හුදෙක් පෞද්ගලික අධ්‍යාපනය සඳහා

වියදම් කල හැකි පොහොසත් සුලුතරය වෙනුවෙන් මිස පොදුවේ සමස්ත ශිෂ්‍යයන්ගේ ම අයිතිවාසිකම් වෙනුවෙන් නොවේ.

අවිශිබමයේ කැඳවුම්කරු උඳුල් ප්‍රේමරත්න දෙවන කථිකයා විය. ඔහුගේ නිස්සාර සහ ආවේගාත්මක කතාවේ වඩා වැදගත්ම අංගය වුයේ ඔහු නවරත්න බන්ඩා විසින් මතුකල කරුනුවලට පිලිතුරු දීමට අසමර්ථ වීමයි. "අධිරාජ්‍යවාදී බලවේගයන්" විසින් ඌන සංවර්ධිත රටවලට වැරදි ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට බලපෑම් කිරීමට එරෙහි වෙමින් ඔහු කතාව ආරම්භ කලේ ය. දූෂන සම්බන්ධයෙන් ආන්ඩුව හෙලාදුටු ඔහු "පාඩු ලබන පොදු ආයතන පමනක් නොවෙයි ලාභ ලබන පොදු ආයතන පවා පුද්ගලීකරනය කෙරෙමින් පවතිනවා; අපේ පාලකයෝ අකාර්යක්ෂමතාවයේත්, සොරකමේත්, මංකොල්ලකෑමේත් සුරයෝ" යැයි ප්‍රකාශ කලේ ය.

ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි බලකඳවුරු සහ ආයතන වෙලඳපොල අරමුනු කර ගත් න්‍යායපත්‍ර කෙරෙහි බලපෑම් කරන බව සැබෑය. කෙසේ නමුත් පුද්ගලීකරනය කිරීමේ ව්‍යාපාරය ශ්‍රී ලංකාවට හෝ ඌන සංවර්ධිත රටවලට පමනක් සීමා වූවක් නොව පසුගිය දශක තුන තිස්සේ ම ලෝකය පුරා ධනේශ්වර ආර්ථිකයන්හි ක්‍රියාත්මක වෙන විශ්ව ව්‍යාප්ත සන්තතියකි. ලාභය ක්ෂය වී යෑම විසින් ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලිය සමෝධානය කිරීම වෙත යොමු කර ඇති අතර, ඒ සඳහා සමාගම් හා ආයෝජකයන් විසින් පුද්ගලික ලාභය සඳහා අධ්‍යාපනය හා සෞඛ්‍ය ඇතුලු ආර්ථිකයේ සෑම ප්‍රදේශයක්ම විවර කිරීම ඉල්ලා සිටිනවා පමනක් නොව අඩු බදු සහ වැඩි වෙලඳ දිරිදීම් වෙනුවෙන් පොදු සේවාවන් කාප්පාදු කිරීමට රජයන්ට බල කරමින් සිටී.

ධනේශ්වර දේශපාලනයට ආවේනික වූවක් වන දූෂනය විසින් කිසිවක් පැහැදිලි නොකරයි. "දූෂනය හා අකාර්යක්ෂමතාවයට" වඩා මූලික වශයෙන් ඇත්තේ ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව විසින් දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) හා සමස්තයක් ලෙස රටේ දෙමල සුලුතරයට එරෙහිව සාපරාධී වාර්ගික යුද්ධය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කරන ලද සුවිසල් ආරක්ෂක වැය ප්‍රමානයන් ය. කෙසේ නමුත් ජවිපෙ අවසානය දක්වා ම යුද්ධයට සහාය ලබා දුන් අතර අධ්‍යාපනය ඇතුලු මූලික සමාජ සේවාවන්ට යෙදවිය යුතු මුදල් කපා හරිමින් මිලිටරිය වෙනුවෙන් රුපියල් බිලියන ගනනින් මුදල් නාස්තිකල අයවැය ලේඛනයන්ට පාර්ලිමේන්තුවේ දී තම ඡන්දයෙන් සහාය ලබා දුන්නේ ය.

ආන්ඩුවේ යුද අපරාධ හා මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳ විදේශ බලවේගයන්ගේ නිහඬ විවේචන හෙලා දකිමින් කථා කල ප්‍රේමරත්න යුද්ධයට තමන්ගේ ඇති සහය පැහැදිලිව පෙන්නුම් කලේ ය. එල්ටීටීඊ ය සමග 2002 දී සටන් විරාමයක් සඳහා තැරැව්කාරකම් කිරීම පිලිබඳවත් දිවයිනේ උතුරු හා නැගෙනහිර කලාප සඳහා ප්‍රාදේශීය ස්වයං පාලන පදනමක් යටතේ එල්ටීටීඊය සමග ගනුදෙනුවකට එලඹීම පිනිස ගන්නා ලද සෑම වෑයමක්ම සම්බන්ධයෙනුත් ඔහු නෝර්වේ රජය හෙලා දුටුවේ ය. දැන් ප්‍රේමරත්න විසින් අකාර්යක්ෂම භාවයේත්, හොරකමේත්, මංකොල්ලකෑමේත් මාස්ටර් ලෙස හෙලා දකින රාජපක්ෂට ජවිපෙ 2005 ජනාධිපතිවරනයේ දී මහජන සහය ලබාදීමට කටයුතු කිරීමේ දී ප්‍රධානතම කරුන වූයේ නැවත යුද්ධයට යායුතු බවට වු ජවිපෙ කල අවධාරනය යි.

පොදු අධ්‍යාපනය සඳහා ප්‍රේමරත්නගේ තර්කය පදනම් වූයේ ද එකී වාර්ගික ජාතිකවාදී දේශපාලනය මතය. පුද්ගලික විශ්වවිද්‍යාලවල පරමාර්ථය වන්නේ රට ගැන, මාතෘභූමිය ගැන නොසිතන, ජාතික සංස්කෘතිය වනසන සමාජ ස්ථරයක් බිහි කිරීමයි. ඔහු ප්‍රකාශ කලේ ය. වෙනත් වචන වලින් කියන්නේ නම් අවිශිබම සහ ජවිපෙ පොදු අධ්‍යාපනය ආරක්ෂා කිරීමට පෙනී සිටින්නේ සියල්ලන් සඳහාම උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් ලබා දීමේ අරමුනින් නොව හුදෙක් ඔවුන්ගේ ප්‍රතිගාමී ජාතිකවාදී මතවාදයන් බෙදා හැරීමේ වාහකයක් ලෙස යොදා ගැනීම සඳහා පමනි. විශේෂයෙන්ම තම

දේශප්‍රේමී ව්‍යාපාරයට සහය දීම ප්‍රතික්ෂේප කල දේශපාලන විරුද්ධවාදීන් සහ කම්කරුවන් ජවිපෙ විසින් මරා දැමූ 1987-89 වකවානුවේ ඔවුන්ගේ සටන් පාඨය වූයේ "පලමුව මව්බිම දෙවනුව අධ්‍යාපනය යන්නයි."

තම අවුල් සහගත කථාවේ අවසානය තෙක්ම තම ප්‍රතිගාමී නවරත්න බන්ඩාගේ ප්‍රධාන තර්කයට පිලිතුරු දීමට ප්‍රේමරත්න අසමර්ථ විය. එනම් ලොව කිසිම රජයකට උසස් තත්ත්වයේ නිදහස් අධ්‍යාපනයක් ලබා දිය නොහැකි යන්නත් එය "යුතෝපියාවක්" යන්නත් ය. ධනේශ්වර රාමුව තුල එය නිශ්චිත සත්‍යයකි. නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන හා ස්ථිර කරන අරගලයක්, වරප්‍රසාද ලත් සුලුතරයකගේ ලාභ අපේක්ෂාවන් නොව සැම දෙනාගේම මූලික සමාජ අවශ්‍යතාවයන් තහවුරු කරන සමාජයක් ශ්‍රී ලංකාවේත් ජාත්‍යන්තරවත් ස්ථාපිත කරන්නාවූ සමාජවාදී වැඩ පිලිවෙලක් මත පදනම් විය යුත්තේ ඒ නිසා ය.

මාවෝවාදය, චේගුවේරාවාදය හා සිංහල ස්වෝත්තමවාදය මත පදනම් වෙමින් 1960 දී ජවිපෙ බිහිකරන විටදී සමාජවාදී ප්‍රතිපත්ති වල අවශ්‍යතාවය පිලිබඳ ජනප්‍රියවාදී සඳහන් කිරීම් කලේ ය. දශක හතරකට පසුව පක්ෂය හා එහි විශ්වවිද්‍යාල පෙරමුනු සංවිධානය වර්ගවාදී දේශපාලනයේ අධම ප්‍රලාපකයන් වී සිටී. අධිරාජ්‍යවාදය පිලිබඳ එය ඇතැම් විට කරන හෙලා දැකීම් විසින් සිදු කරන්නේ හුදෙක් ශ්‍රී ලංකාවේ ධනවාදය හා ජාතික ධනපතියන් ආරක්ෂා කිරීම සඳහා පමනි. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය යැයි කියමින් ඇෆ්ගනිස්ථානය හා ඉරාකය ඇතුලු රාජ්‍යයන් තුල එක්සත් ජනපදය සිදු කරන බලහත්කාරයන් ජවිපෙ විසින් නිහඬව ම ඉවසා දරා සිටින ලදී.

දශකයකට වඩා කාලයක් තිස්සේ ජවිපෙ කොලඹ සංස්ථාපිතයේ කොටසක්ව සිටී. 2004 දී එය ජනාධිපති චන්ද්‍රිකා කුමරතුංග හා රාජපක්ෂ අගමැති විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගින් නායකත්වය දුන් සන්ධාන රජයට එක් විය. එහි මන්ත්‍රීවරුන් පුද්ගලීකරනය ඇතුලු තවදුරටත් වෙලඳපොල සුරක්ෂිත කරන "ප්‍රතිසංස්කරන" ඇතුලත් ආන්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තීන්ට ඡන්දය ලබා දුන්හ. සංගත ආයෝජකයන්ට ලොව විශාලම ලාභ ශ්‍රම වේදිකාව විවර කර දෙමින් එය මත පාලනය ගෙන යන පොලිස් රාජ්‍යයක් වන චීනය ශ්‍රී ලංකාව විසින් අනුගමනය කල යුතු ආකෘතිය ලෙස ජවිපෙ දක්වා සිටී.

නවරත්න බන්ඩා සමග ව්‍යාජ විවාදයක් පවත්වන අතරම, සමාජවාදී සමානතා පක්ෂය හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ "(සසජාශි) විසින් තම සාහිත්‍යය අඩංගු පොත් මේසයක් තැබීමට ගත් උත්සාහය හා ඔවුනට ඇහුම්කම් දීම වැලැක්වීමට අවිශිබම ය පියවර ගෙන තිබුනි. සසජාශි නිෂ්ශබ්ද කිරීම සඳහා ගන්නා උත්සාහය අහම්බයක් නොවේ. නවරත්න බන්ඩා හා ප්‍රේමරත්න මෙන් අන් සියලුම ලාභ පද්ධතියේ රැකවලුන්ට එරෙහි විකල්පයක් සපයනුයේ සසප සහ සසජාශි පමනි. නිදහස් උසස් තත්ත්වයේ අධ්‍යාපනය යනු යුතෝපියාවක් නොව ධනවාදය අහෝසි කිරීමෙන් පමනක් ම ලබා ගත හැකි සමස්ත වැඩ කරන ජනතාවගේ ම මූලික අයිතියකි. නිශ්චිතව ම ශිෂ්‍යයන් දැන් යොමු විය යුත්තේ සමාජවාදී ජාත්‍යන්තරවාදය පිලිබඳ ඉදිරිදර්ශනය වෙත ම ය.